# ලංකාණ්ඩුවේ ගැසට් පත්‍රය

අංක 12,087 — 1960 මාර්තු 18 වැනි සිකුරාද — 18.3.1960

(ආණ්ඩුවේ බලය පිට ප්‍රසිද්ධ කරන ලදි)


# IV වැනි කොටස — පළාත් පාලනය

(වෙන වෙනම ගොනුකර ගතහැකි පරිදි, සෑම කොටසකටම අයත් එක් එක් භාෂාවකට වෙන වෙනම පිටු අංක යොදා ඇත.)


| | පිට | | පිට |
|---|---|---|---|
| පළාත් පාලන නිවේදන ... ... | — | ආදායම් හා වියදම් පිළිබඳ ප්‍රකාශ ... | — |
| තනතුරු—ඇබෑර්තු ... ... | — | අය-වැය ලේඛන — — | — |
| විභාග, විභාග ප්‍රතිඵල ආදිය ... | — | දේපල විකිණීම ... ... | — |
| අතුරු ව්‍යවස්ථා ... ... | — | මාගී කොමිටි දැන්වීම් ... ... | — |
| පළාත් පාලන සහ ඡන්ද ආඥාපනත යටතේ දැන්වීම් ... ... ... | — | විවිධ දැන්වීම් — — | 67 |


## විවිධ දැන්වීම්

### යටිනුවර ගඟපළාත ගම්කාර්ය සභාව (මහනුවර දිස්ත්‍රික්කය)

**මස් පිණිස සතුන් මරන්නන් පිළිබඳ ආඥාපනත (201 වන පරිච්ඡේදය)**

යටිනුවර ගඟපළාත ගම්කාර්ය සභා ප්‍රදේශය තුළ නාගරික මස් මඩුවෙන් මරණ ලද එළු හා හරක් මස් විකිණීමේ කඩයක් පවත්වා ගෙන යාම සඳහා 1960 වර්ෂයට බලපත්‍රයක් නිකුත් කරණ ලෙස ඉල්ලා මෙහි පහත උපලේඛනයෙහි සඳහන් අය විසින් මා වෙත අයදුම් පත් එවා තිබෙන බව 1947 අංක 44 දරන ආඥාපනතේ 6 වැනි වගන්තියෙන් සංශෝධිත වූ සතුන් මරන්නන් පිළිබඳ ආඥාපනතේ (201 වන පරිච්ඡේදය) 7 වැනි වගන්තිය යටතේ මෙයින් දැනුම් දෙනු ලැබේ.

ඒ සඳහා බලපත්‍ර නිකුත් කිරීම සඳහා විරුද්ධවාදිකම් දැන්වීමට බලාපොරොත්තුවන්නාවූ මහනුවර දිස්ත්‍රික්කයේ යටිනුවර ගඟ පළාත ගම්කාර්ය සභා ප්‍රදේශය තුළ පදිංචි ඕනෑම කෙනෙකුට මෙම දැන්වීම ගැසට් පත්‍රයේ පළවූ දින සිට දින 14ක් ඇතුළතදී තම විරුද්ධත්වය ලියවිල්ලකින් ප්‍රකාශ කළ හැකි බවත් එසේ එවන සෑම විරුද්ධවාදිකමක්ම පිටපත් දෙකකින් යුක්ත විය යුතු බවත් විශෙෂයෙන් සැලකිය යුතුයි.

එච්. ඇම්. පී. ශරත්චන්ද්‍ර,
ප්‍රධාන තැන.

වර්ෂ 1960 ක්වූ පෙබරවාරි මස 16 වෙනි දින,
මුරුතලාවේ යටිනුවර ගඟපළාත ගම්කාර්ය
සභා කාර්යාලයේදීය.

#### උපලේඛනය

| ඉල්ලුම්කරුගේ නම | වෙළඳාම පවත්වාගෙන යනු ලබන ස්ථානය |
|---|---|
| ඒ. ඇල්. ඇම්. ෂරීෆ් | පේරාදෙණිය වටුම අංක 68/පී.ඊ. |

---

### බින්තැන්න ගම්කාර්ය සභාව

**මස් පිණිස සතුන් මරන්නන් පිළිබඳ ආඥාපනත**

මෙහි පහත දැක්වෙන උපලෙඛනයෙහි සඳහන් අය විසින් මස් පිණිස සතුන් මරා මස් විකිණීම පිණිස 1960 වර්ෂයට බල පත්‍රයක් ඉල්ලුම් කර තිබෙන බවත්, මෙම බල පත්‍රය නිකුත් කිරීමට විරුද්ධව බින්තැන්න ගම්කාර්ය සභා ප්‍රදේශය ඇතුළත පදිංචි ඕනෑම කෙනෙකුට තමා ඒ සඳහා විරුද්ධ වන්නේ අසවල් කරුණු නිසා යයි දැක්වෙන ලියවිල්ලක් පිටපත් දෙකකින් යුක්තව මෙම දැන්වීම ගැසට් පත්‍රයේ පළවන දින සිට 14 දිනක් ඇතුළත මා වෙත එවිය යුතු බවත්, මස් පිණිස සතුන් මරන්නන් පිළිබඳ ආඥාපනතේ 201 වෙනි පරිච්ඡේදයේ අංක 7 දරණ 1947 අංක 44 ආඥාපනතින් සංශොධිත වූ අංක 6 දරණ ආඥාපනත යටතේ මෙයින් දැනුම් දෙනු ලැබේ.

#### උපලේඛනය

| ඉල්ලුම්කරුගේ නම | ස්ථානය | වෙළඳාම |
|---|---|---|
| ඇස්. අබ්දුල් අසීස් ... | ප්‍රසිද්ධ වෙළඳ පොල, අළුත්නුවර | හරක් මස් |

ඩබ්ලිව්. ඇම්. පොන්සේකා,
බින්තැන්න ගම්කාර්ය සභාවේ සභාපති.

බින්තැන්න ගම්කාර්ය සභා කාර්යාලය,
මහියංගණය,
5. 3. 1960.

## විශෙෂ නිවේදනයයි

1960 මාර්තු 29 වැනි අඟහරුවාදා ආණ්ඩුවේ නිවාඩු දිනයක් වන බැවින්, 1960 අප්‍රේල් 1 වැනි දින නිකුත් කරනු ලබන ලංකාණ්ඩුවේ ගැසට් පත්‍රයෙහි පළකිරීම සඳහා එවන සියළුම දැන්වීම් සහ නිවේදන, 1960 මාර්තු 26 වැනි සෙනසුරාදා පස්වරු 12.30 ට ප්‍රථම ආණ්ඩුවේ මුද්‍රණාලයට ලැබෙන්නට සැලැස්විය යුතු බව කාගේත් දැනගැනීම සඳහා මෙයින් නිවේදනය කරමි.

1960 මාර්තු 1 වැනි දින,
ආණ්ඩුවේ මුද්‍රණාලය,
කොළඹ.

බර්නාඩ් ද සිල්වා,
ආණ්ඩුවේ මුද්‍රණාලයාධිපති.

ලංකාණ්ඩුවේ මුද්‍රණාලයේ මුද්‍රණය කරන ලදී.